# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහායක තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2015

1. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහායක III වන ශ්‍රේණියේ තනතුරු 33ක් සඳහා බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් මධ්‍යම පළාතේ පදිංචිකරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහායක තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීමට තෝරාගනු ඇත.

3. වයස් සීමාව :

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4. අධ්‍යාපන සුදුසුකම් :

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, සහ විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා/පෙළ) විභාගය එක් වරකදී සමත්වී තිබීම.

5. වෘත්තීය සුදුසුකම් :

ඉහත අංක 04 හි අධ්‍යාපන සුදුසුකම් සහිතව ජාතික වෘත්තීය සුදුසුකම්වල (NVQ) 05 වන මට්ටමේ රජයේ පිළිගත් තාක්ෂණ/කාර්මික විද්‍යාලයකින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම.

6. වෙනත් සුදුසුකම් :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ)විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ)අයැදුම්කරු මධ්‍යම පළාත් බල ප්‍රදේශය තුළ අයැදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්නයේ නොකඩවා වසර 03ක් ස්ථිරවම පදිංචිව සිටි බව සනාථ කළ යුතුය.

7. වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MT1- 2006A

රු. 14,425 - 10 x 145 - 11 x 170 -6 x 240 - 14 x 320 - රු. 23,665

III වන ශ්‍රේණියට පත්වීම් ලබා වසර 03ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 පරිදි අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

8. සේවා කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

ii. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් මධ්‍යම පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පුරප්පාඩු පවතින ආයතන වෙත අනුයුක්ත කරනු ඇත.

iii. තෝරාගන්නා ඉල්ලුම්කරුවන් මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත්වනු ඇත.

iv. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථානමාරු ලබා ගැනීමට හෝ වෙනත් තනතුරකට මුදාහැරීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද පත්කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 3ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළයුතුය.

v. තෝරාගනු ලබන අයැදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලට රජය හා මධ්‍යම පළාත් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

9.

(i) බඳවා ගැනීමේ ක්‍රමය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහණ අනුපාතය අනුව ඉහත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණකින් අනතුරුව එම ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදුනොවන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා ඉල්ලුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

(ii) විභාග ක්‍රමය :

(අ) විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රිසි මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(iii) විභාගයේ විෂයන් :

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය
2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

10. විෂය නිර්දේශය :

1. බුද්ධි පරීක්ෂණය :

කාලය පැය 01 කි
මුළු ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීම, විනිශ්චය කිරීම සඳහාවූ ප්‍රශ්නවලින් යුක්තය.

2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය :

කාලය පැය 03 කි
මුළු ලකුණු 100 යි.

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍යය බැහැර කිරීමේ ක්‍රියාපිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු දැනුම විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් ඉල්ලුම් කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

11. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කල හැකිය.
ඉල්ලුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු / ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. විභාග ගාස්තු :

විභාග ගාස්තු රු. 600 කි. මෙම මුදල මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවෙන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත ඉල්ලුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතුය.) කිසිම හේතුවක් නිසා වත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

13. ඉල්ලුම්කළ යුතු ක්‍රමය :

(අ) ඉල්ලුම්පත්‍ර A4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.

(iii) ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ඉල්ලුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව ඉල්ලුම්කරු විසින් සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ආ) ආදර්ශ ඉල්ලුම්පත්‍රය www.psc.cp.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2015 මැයි මස 29 වැනි දින හෝ ඊට කලින් පහත ලිපිනයට එවිය යුතුය.

**'ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**අංක 244, කටුගස්තොට පාර,**
**මහනුවර.'** .

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව" මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහායක තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය -2015 " යනුවෙන් සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඈ) දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් ඉල්ලුම්පත්‍රයේ අංක 12.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් සහතික කරන ලද ඉල්ලුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

(ඉ) විභාග මධ්‍යස්ථාන පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ. ඉල්ලුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් **පුවත්පත් නිවේදනයක්** මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පළ කරනු ඇත. එම නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් ඉල්ලුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ෆැක්ස් මඟින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(ඊ) ඉල්ලුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

(උ) කිසියම් අපේක්ෂකයෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

14. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

i.පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

ii.වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභාව ,

2015 මැයි මස 07 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය.

# ආදර්ශ ඉල්ලුම්පත්‍රය

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහායක තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවාගැනීමේ විවෘත තරඟ විභාගය - 2015

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය

මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම : ..........................................
..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : ..........................................
..........................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

2.0

2.1 ස්ථිර ලිපිනය : ..........................................
..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය : ..........................................
..........................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..........................................
..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 තැපැල් නගරය : ..........................................
..........................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ – 0
ස්ත්‍රී - 1

3.2 උපන් දිනය : වර්ෂය

| | | | |
|---|---|---|---|
| | | | |

මාසය

| | |
|---|---|
| | |

දිනය

| | |
|---|---|
| | |

3.3 2015.05.29 වැනි දිනට වයස : අවුරුදු මාස දින

4.0 අධ්‍යාපන සුදුසුකම් ඃ

4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

(i) විභාගයේ වර්ෂය හා මාසය :―――――.
(ii) විභාග අංකය :―――――.

(iii) ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ (සමත්ව ඇත්නම්)
(i) විභාගයේ වර්ෂය හා මාසය :―――――.
(ii) විභාග අංකය :―――――.
(iii) ප්‍රතිඵල :―――――.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

5.0 තාක්ෂණ සුදුසුකම් ඃ

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතික පත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් :―――――.

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

7.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය :―――――.

7.2 දැනට දරන තනතුර :―――――.

7.3 සේවා කාලය :―――――.

7.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන බව:―――――.

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින්වරදකරු කරනු ලැබ තිබේද?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.

(ii) ලදුපත් අංකය හා දිනය :—————.

(iii) ගෙවූ මුදල :—————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

10.0 ඉල්ලුම් කරුගේ සහතිකය ඃ

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

11.0 ඉල්ලුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන .................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :—————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.

තනතුර :—————.

ලිපිනය :—————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12.0 ඉල්ලුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවාවේ නියුතු අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

……………………………… මයා/මිය/මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/ තාවකාලික/අනියම් පදනමින් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,

දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය:————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :——